**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.11 පැය 1105 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 707 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්‍ා වූ වැදගත් තොරතුරු**</u>

**01. අයිස් මත්ද්‍රව්‍ය, කුෂ් මත්ද්‍රව්‍ය හා මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බලංගොඩ විශේෂ දූෂණ වැටලීම් ඒකකය.**

2025.04.10 වන අද දින සවස් කාලයේ වැලිගෙපොල පොලිස් වසමේ ෆලිල් හාජ්ජියාර් මාවත ප්‍රදේශයේදී බලංගොඩ විශේෂ දූෂණ වැටලීම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 51 මිලිග්‍රෑම් 250 ක්, කුෂ් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 09 මිලිග්‍රෑම් 270ක්, මත්කරල් 16 ක්,** මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන මුදල් රුපියල් 1052500/= ක් හා විද්‍යුත් තරාදි 02 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැලිගෙපොල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 48 ක් වන බලංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැලිගෙපොල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි. වැටලීමට අදාල ඡායාරූපයක් සහ වීඩියෝ පටයක් මේ සමඟ යොමු කරමි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කෙසෙල්වත්ත පොලිස් ස්ථානය.**

2025.04.11 වන දින අළුයම් කාලයේ කෙසෙල්වත්ත පොලිස් වසමේ මුහන්දිරම් පාර, කොළඹ 12 ප්‍රදේශයේදී කෙසෙල්වත්ත පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 250 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 26 ක් වන මුහන්දිරම් පාර, කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කෙසෙල්වත්ත පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**